(145)

1\. සබරගමුව පළාත් සභාව – சப்பிரகமுவ மாகாண சபை – Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு**

**Ministry Of Education, Information Technology & Cultural Affairs**

***Email//:edusabaram@gmail.com Facebook//:SabEducationMinistry***


| මගේ අංකය<br>எனது இல<br>My Number | ME/E/2/(සබර/චක්‍ර ලේඛ) | ඔබේ අංකය<br>உமது இல<br>Your Numt | | දිනය<br>திகதி<br>Date | 2014.08. 08 |
|---|---|---|---|---|---|

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ
අංක : සබර/2014/23

සබරගමු පළාත් සභා පාසල් වල සියළුම විදුහල්පතිවරුන් වෙත,

**<u>අතිරික්ත ගුරුවරුන් සම්බන්ධව කටයුතු කිරීම.</u>**

සබරගමුව පළාතේ ඇතැම් පාසල් වල අනුමත කාර්ය මණ්ඩලය අභිබවා ගුරුවරුන් රඳවාගෙන සිටින බවට මා වෙත වාර්තා වී ඇත. තවද මේ වන විටත් මේ සම්බන්ධයෙන් විගණන විමසුම් ලැබී ඇති අතර, අතිරික්ත ගුරුවරුන් තබා ගැනීම හේතුවෙන් එම ගුරුවරුන්ට ගෙවන ලද වැටුප් අදාළ විදුහල්පතිවරුන්ගෙන් අයිභාර කරගැනීමට කටයුතු කරන ලෙසට විගණන අධිකාරී විසින් දැනුම් දී ඇත.

02\. එබැවින් අතිරික්ත ගුරුවරුන් තුලනය කිරීම සඳහා අදාළ නිවැරදි තොරතුරු වහාම මා වෙත ලබා දිය යුතු බවට මෙයින් අවධාරණය කරන අතර, ඔබ පාසලට අනුමත කාර්ය මණ්ඩලය පමණක් තබා ගත යුතු බවද වැඩි දුරටත් දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පහත කරුණු කෙරෙහි විශේෂයෙන් ඔබගේ අවධානය යොමු කරවමි.

- ❖ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2003/38 දරණ චක්‍රලේඛයේ 2.1.2 හා 2.1.3 වගන්ති ප්‍රකාරව විෂය ඉගැන්වීමේ නිරත ගුරු භවතුන් විසින් සතියකට කාලච්ඡේද 35 ක් ඉගැන්විය යුතු අතර පන්තියක් භාරව කටයුතු කරන ගුරු භවතුන් සතියකට කාලච්ඡේද 33 ක් ඉගැන්වීමේ නිරත විය යුතුය. උසස් පෙළ විෂය උගන්වන ගුරු භවතුන් අවම වශයෙන් කාලච්ඡේද 30 ක් සතියකට ඉගැන්වීමේ කටයුතුවල නිරත විය යුතු අතර, අධීක්ෂණ කාර්යයේ නියුතු ගුරු භවතුන් සතියකට අවම වශයෙන් විනාඩි 40 කාලච්ඡේද 16 ක් ඉගැන්වීමේ කාර්යයේ නිරත විය යුතුය.
- ❖ පහත විෂයන් වලට අදාලව ගුරුභවතුන් පාසලේ රඳවා ගැනීමේදී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2003/38 චක්‍රලේඛය ප්‍රකාරවම කටයුතු කළ යුතුය.
    - ✔ උපදේශන කාර්යයේ නියුතු ගුරුභවතුන්
    - ✔ පුස්තකාල කටයුතු භාර ගුරු භවතුන්
    - ✔ නියෝජ්‍ය විදුහල්පතිවරුන්
    - ✔ ක්‍රීඩා භාර ගුරු භවතුන්
- ❖ පාසල් වල සමාන්තර පන්ති පවත්වා ගෙන යන්නේ නම් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2006/20 හා 2008/17 හි විධිවිධාන පරිදි ඒ ඒ ශ්‍රේණි වල තබා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.

  උදා:- ඇතැම් පාසල් වල ළමුන් 20 හා 22 වශයෙන් රඳවා තබා ගෙන සමාන්තර පන්ති දෙකක් ලෙස පවත්වාගෙන යාම.

- ❖ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පරීක්ෂා කර බලා අනුමත කාල සටහනේ කාලච්ඡේද නොමැති ගුරු භවතුන් පාසලේ රඳවා තබා ගැනීම නොකල යුතුය.


**ගරු අමාත්‍යතුමා** Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001

**අමාත්‍යාංශ ලේකම්** Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000

**කාර්යාලය** Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

❖ අතිරික්ත ගුරුවරුන් නම් කිරීමේදී තම පාසලේ සේවය කර ඇති වසර ගණන විෂයයන් අනුව විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය. වසර 05 කට වඩා එකම පාසලේ සේවය කර ඇති ගුරුභවතුන් ස්ථාන මාරුවීම් වලට යටත්වේ. අතිරික්ත ගුරුභවතුන් නම් කිරීමේදී ඒ ඒ විෂයයන් ප්‍රකාරව සිටින සියළුම ගුරු භවතුන් එම පාසලේ සේවය කළ සේවා කාලය වසර 05 කට අඩු වන්නේ නම් අතිරික්ත ගුරුභවතා ලෙස නම් කල යුතු වන්නේ අවසානයට පාසලට පැමිණි ගුරුභවතාය.

❖ තම පාසලේ ගුරු පුරප්පාඩු පවතින බවට විවිධ ගුරුභවතුන්ට බොහෝ පාසල් වල විදුහල්පතිවරුන් විසින් පෞද්ගලිකව ලිපි නිකුත් කිරීම සිදු කරන හෙයින් මින් ඉදිරියට එසේ නොකල යුතු බවට මෙයින් අවධාරණය කරන අතර, ගුරු පුරප්පාඩු වේ නම් ඒ බව කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැන්වීම පමණක් විදුහල්පති විසින් කළ යුතුය. එය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පමණක් කළයුතු කාර්යක් බව මෙයින් අවධාරණය කරමි.

03. ඉහත කරුණ පිළබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කර මෙම චක්‍රලේඛයේ උපදෙස් තරයේ පිළිපදින ලෙස මෙයින් දන්වා සිටින අතර, චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව කටයුතු කරන විදුහල්පතිවරු සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීමට හා අතිරික්තව තබා ගන්නා ගුරුවරුන්ට ගෙවන ලද වැටුප් අදාල විදුහල්පතිවරයාගේ වැටුපෙන් අඩිහාර කිරීමට සිදුවන බවත් අවධාරණය කරමි.

04. එමෙන්ම ගුරු තුලනය සම්බන්ධව අධීක්ෂණ වගකීම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වන අතර ,එම වගකීම නිසි පරිදි ඉටු නොකරන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සම්බන්ධවද විනයානුකූල පියවර ගැනීමට සිදුවන බවත් දන්වා සිටිමි.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

මහින්ද එස් වීරසූරිය.
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

**පිටපත්:-**

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, - දැ.පි
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු, - දැ.පි
3. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු, - දැ.පි
4. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත. } ඔබගේ ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී මෙම චක්‍රලේඛයේ කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම සඳහා.
5. විගණන අධිකාරී -රත්නපුර/ කෑගල්ල - දැ.පි
6. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ (සබර) - දැ.පි